# ලංසුකැඳවීමයි

ලංසුඅංකය: LV / S / Fly Ash /003

## නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ 01, 02 සහ 03 ඒකකයෙන් නිෂ්පාදනය කරන ලද පියාසර අළු (Fly Ash) විකිණීම.

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) වෙනුවෙන් අමාත්‍යය මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩලයේ (CATB) සභාපතිවරයා විසින් නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ ඒකක 01, 02 සහ 03 මගින් නිපදවනු ලබන පියාසර අළු (Fly Ash) විකිණීම සඳහා මුද්‍රා තැබූ ලංසු 08/02/2023 පෙ.ව 10.00 දක්වා කැඳවනු ලැබේ.ලංසු ඉදිරිපත් කළයුත්තේ ලංවිමෙන් මිලදී ගන්නා ලියකියවිලි මත පමණි.

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසු කරුවන්ට නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ (LVPP) ඉංජිනේරු (වාණිජ) කාර්යාලයේදී සහ ලංවිම වෙබ් අඩවියෙන් (www.ceb.lk/tender Click Here) ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කළහැක.

මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරුවන්ට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු බලස්ථාන කළමනාකරු (LVPP), ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චෝලේ යන ලිපිනයට ආපසු නොගෙවන ගාස්තුවක් ලෙස එක් ටෙන්ඩර් පොතක් සඳහා රුපියල් 100,000/- බැගින් ගෙවා මිලදී ගත හැක. 07/02/2023 දක්වා ඕනෑම වැඩ කරන දිනයක පෙ.ව 09.00 ත් ප.ව 15.00 ත් අතර මහජන බැංකුවේ ගිණුම් අංක 204200140085134 සාමාන්‍යාධිකාරී ලංවිම නමින් ලියන ලද බැංකු කෙටුම්පතක් හෝ තැන්පතු පත්‍රිකාවක් මඟින් ගෙවීම් කර ටෙන්ඩර් පොත ලබා ගත හැක.

ලියාපදිංචි තැපෑලෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු - ජනක අංශය), 2 වන මහල ජනන මූලස්ථානය, ලංකා විදුලිබල මණ්ඩලය, නව කැලණි පාලම පාර, කොළොන්නාව, 10600 යන ලිපිනයට තැපැල් කර එවීම හෝ මෙම ලිපිනයෙහි මේ සඳහා ලබාදී ඇති ලංසු පෙට්ටියට ගෙනවිත් භාරදීම, 08/02/2023 දින පෙ:ව: 10.00 හෝ ඊට පෙර සිදුකල යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු කැඳවීම අවසන්වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් අය ඉදිරියේ ලංසු විවෘත කිරීම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු - ජනන අංශය), 2 වන මහල ජනන මූලස්ථානය, ලංකා විදුලිබල මණ්ඩලය, නව කැලණි පාලම පාර, කොලොන්නාව යන කාර්යාලයේදී සිදුකෙරේ.

ලංසු ආරක්ෂාවෙහි (Bid Security) වටිනාකම වසර (1) කාලසීමාව තුළ මිලදී ගැනීමට අපේක්ෂිතඅවම පියාසර අළු (Fly Ash) ප්‍රමාණයෙන් 1% ක වටිනාකමට සමාන විය යුතුය. ලංසු ආරක්ෂාවේ වලංගු කාලය ලංසු කැදවීම අවසන් වන දින සිට දින එකසිය පනහක් (150) සඳහා වලංගුවිය යුතුය.

ලංසුවෙහි වලංගු කාලය, ලංසු කැඳවීම අවසන්වීමේ දිනය සිට දින එකසිය විස්සක් (120) දක්වා වලංගුවිය යුතුය.

ලංසු කැඳවීම අවසන් වන දිනට සති දෙකකට පෙර සියලුම පැහැදිලි කිරීම් බලස්ථාන කළමනාකරු (LVPP), ලංකා විදුලි බල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චෝලේ යන ලිපිනයෙන් ඉල්ලා සිටිය යුතුය.

සියළු විමසීම්- දුරකථන: 0322268964 / 0322268965

බලස්ථාන කළමනකරු (ළක්විජය බලාගාරය),<br>
ලංකා විදුලිබල මණ්ඩලය,<br>
නාරක්කල්ලිය, නොරොච්චොලේ.